ලිංගික අපරාධයන් විස්තර කිරීම සඳහා “දූෂණය” වැනි යෙදුම් භාවිතා කිරීමෙන් වැළකීම සුදුසු වන්නේ, එම යෙදුම ඔස්සේ එය එවැනි අපරාධවලට මුහුණ පෑ අයවලුන් අපවිත්‍ර වී ඇතැයි හැඟවීමත්, ඒ ඔස්සේ ඔවුන් සමාජය තුළ ගර්හාවට පාත්‍ර වීමට සහ කොන් කිරීමකට බඳුන් වීමත් සිදුවිය හැකි බැවිනි.

“දූෂණය” යන යෙදුම ශ්‍රී ලංකාවේ නීති පොත් තුළද සඳහන් වන බව සත්‍යයකි. නමුත් කෙනෙකු අපවිත්‍ර බව හැඟෙන එවැනි යෙදුම්, දිවි ගලවාගත් අයට නැවත ජීවිතය පටන් ගැනීමට අභිප්‍රේරණයක් ලබා දෙනවා වෙනුවට තව තවත් ඔවුන්ගේ ආත්ම විශ්වාසය පහත දැමීමක් සිදු නොකෙරෙන්නේ දැයි අප විමසිය යුතුයි.

ලංකාදීප (පෙබරවාරි 09, 2022), අරුණ (පෙබරවාරි 09, 2022) , මව්බිම (පෙබරවාරි 10, 2022) සහ දිනමිණ (පෙබරවාරි 10, 2022) පුවත්පත්වල තරුණියක් ලිංගික අපරාධයකට ලක්වීමක් පිළිබඳ පුවතක් වාර්තා විය. මෙම සිරස්තල සියල්ලෙහිම “දූෂණය” යන යෙදුම භාවිතා වී තිබිණි.

එසේ නම්, “දූෂණය” යන යෙදුම භාවිතා නොකරමින්, පහත ආකාරයෙන් එම සිරස්තල පළ වූයේ නම් එය වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

- කොල්ලුපිටිය හෝටලයකදී ජර්මන් තරුණියක මත්කර ලිංගික අපරාධයකට ලක් කළැයි පැමිණිල්ලක්; ව්‍යාපාරිකයෙක් අත්අඩංගුවට

- ජර්මන් තරුණියක ලිංගික අපරාධයකට ලක් කළැයි මෙරට ව්‍යාපාරිකයෙක් අත්අඩංගුවට

- ජර්මන් ජාතික තරුණියක ලිංගික අපරාධයකට ලක් කළ බව කියන ව්‍යාපාරිකයා ලක්ෂ 5ක ඇපමත මුදාහරී.

- ජර්මන් ජාතික තරුණිය ලිංගික අපරාධයකට ලක් කිරීමේ සිද්ධියේ සැකකාර ව්‍යාපාරිකයා ඇප මත මුදා හරී.

මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?